පොලිස් වාර්තාවන්ගෙන් දැක්වෙන ආකාරයට, 2019 වසර තුළ ශ්‍රී ලංකාවේ දිවි අහිමි කරගැනීම් 3,135 ක් පමණ වාර්තා වී තිබේ. එය දිනකට සාමාන්‍යයක් ලෙසින් ගත්තද දිනකට දිවි අහිමි කරගැනීම් 8.5 කි. දිවි අහිමි කරගැනීම් සම්බන්ධ වාර්තාකරණයන්හිදී ප්‍රවේසම් සහගත හා ආචාර ධාර්මික ප්‍රවේශයක් යොදාගන්නා ලෙසින් නිරන්තරයෙන් මාධ්‍ය දිරිමත් කෙරෙන්නේද මේ හෙයිනි.

කොවිඩ්-19 වැළදීම හේතුවෙන් සිය මව රෝහල්ගත කිරීමෙන් පසු පුතු විසින් දිවි අහිමි කරගනු ලැබූ පුවත විවිධ මාධ්‍ය ඔස්සේ දක්වා තිබූ ආකාරය ඊට උදාහරණයක් ලෙසින් දැක්විය හැක. මෙම පුවත බොහෝ මාධ්‍යයන්හි අවධානයට ලක්ව තිබූ අතර, සමාජ මාධ්‍ය තුළද කථාබහට ලක්ව තිබිණි.

මෙවැනි පුවතක් වාර්තා කිරීමේදී දිවි අහිමි කරගත් ආකාරය පළ නොකරන ලෙසත්, එසේම දිවි අහිමි කරගත් ආකාරය දීර්ඝ ලෙසින් විස්තර නොකරන ලෙසත් මාධ්‍ය ආචාර ධර්ම මාර්ගෝපදේශනයන් තුළ පැවසෙන්නේ, ඒ ඔස්සේ එම ක්‍රමය භාවිතා කරමින් තවත් අයෙකු දිවි අහිමි කරගැනීමකට පෙළඹීමේ ඉඩක් පවතින බැවිනි. එසේම මෙවන් පුවතක් සමගින් උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි අහිමි කරගැනීමට නැඹුරුවක් ඇති අයෙකුගේ දිවි බේරාගැනීමට ඉඩක් ලැබෙනු ඇත.

එසේම ලංකාදීප පුවතේ සඳහන් 'ආබාධිත මානසික පුතු' වැනි යෙදුම් වෙනුවට, 'මානසික ආබාධයක් සහිත' වැනි යෙදුමක් වඩාත් යෝග්‍ය බවද දක්වමු.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:
https://www.police.lk/index.php/item/138 https://accountablejournalism.org/ethics-codes/australia-standards-of-practice-suicide-reporting?fbclid=IwAR0-O1XtdHN7U82_pF46DIwWiaNRXk9Wd-16LFYcReZ6CCm0QNCRR7R9f_g https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=D14833A4878E3B3D96D0721858FB5F4E?sequence=1&fbclid=IwAR1fdTnS9Q7ypAPo7yA5c9CLHDTZ4kgObuTAYFazm1OGnq4GZAgdgepYMUY

#MediaEthicsSL #lka #SinhalaPress #TVNews #Mawbima #Aruna #Lankadeepa #HiruTv